**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය - 2022**

**-------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1** තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය(මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී .

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02හි 25(ඌ) වගන්තිය ප්‍රකාරව ඉදිරි ගනුදෙනු, ඉදිරි ගිවිසුම්, හුවමාරු ගිවිසුම් සඳහා මුදල් ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවද රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ගිවිසුම් යටතේ සමාලෝචිත වර්ෂයේ අධිකාරියට ලැබුණු රු.5,500,000 ක්වූ මුදල මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්රවාහය යටතේ වෙනත් ආදායම් ලෙස දක්වා තිබුණි. | එකඟ වේ. | ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2හි 29 වගන්තිය ප්‍රකාරව සෘජු ක්‍රමයට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේදී අතිරික්තය සමඟ ශුද්ධ මුදල් ප්‍රවාහය සසදා හෙළිදරව් කලයුතු වුවත් අධිකාරිය විසින් එසේ සිදුකර නොතිබුණි. | එකඟ වේ. | ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | අක්කරයක් පමණ වූ මන්නාරම ඔලෛයිතුඩාව මුහුදු කුඩැල්ලන් අභිජනනාගාරයේ ඉඩම රු.800,000 ක වටිනාකමකට 2016 වර්ෂයේ සිට අවු.30 කට බදු පදනම මත ලබාගෙන තිබුණ ද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07හි 06 වගන්තියේ විධිවිධාන අනුව කල්බදු දේපලක් ලෙස ගිණුම්වල හඳුනාගෙන නොතිබුණි. | එකඟ වේ. | බදු පදනම මත ලබාගෙන ඇති ඉඩම් කල්බදු දේපලක් ලෙස ගිණුම්වල හඳුනාගත යුතු වේ. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 8හි 100 වගන්තිය පරිදි වාර්තා කරන දිනට ඇති සෑම අසම්භාවය වගකීමක්ම හෙළිදරව් කළයුතු වුවත්, වැලිකන්ද අභිජනනාගාර ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් කොන්ත්‍රාත් ඉදිකිරීම් සමාගමක් වෙත බේරුම්කරණ සභා තීන්දුවකින් ගෙවීමට සිදුව තිබූ රු.26,839,477 ක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගැනීම හා මහාධිකරණ නඩු ගොනු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබීමද අධිකාරියට එරෙහිව කොන්ත්‍රාත්කරුවන් හා අනිකුත් පාර්ශවයන් අධිකරණයේ ගොනුකර තිබුණු නඩු 10ක් සම්බන්ධයෙන්ද මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය සඳහා වගාකරුවන්ට | 2023 වර්ෂික ගිණුම් තුලින් අධිකාරිය සමඟ පවතින නීති කටයුතු හා අසම්භාව්‍යයන් හෙළිදරව් කිරිමට කටයුතු කරනු ලැබේ. | වාර්තා කරන දිනට ඇති සෑම අසම්භාවය වගකීමක්ම හෙළිදරව් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ලබාදුන්, මුදල් අය නොවීම සම්බන්ධයෙන් අධිකරණයේ පවරන ලද නඩු 193ක් සම්බන්ධයෙන්ද එලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | | |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අධිකාරිය වෙත සංවර්ධන වැඩසටහන් සඳහා ලද රු.482,746,457 ක අමාත්‍යාංශ ප්‍රදාන සහ රු.10,454,968 ක විදේශ ප්‍රදාන වශයෙන් ලද මුළු ප්‍රදාන එකතුව රු.493,201,425 ක ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 11 හි වගන්ති අංක 95 හි විධිවිධාන ප්‍රකාරව ආදායමට හඳුනා ගැනීමකින් තොරව ව්‍යාපෘති ගිණුම්වලට බැර කර තිබුණි. එම වැඩසටහන් සඳහා සමාලෝචිත වර්ෂයේ දරන ලද රු.483,621,100 ක් වූ මුළු වියදම ද ආදායම් ප්‍රකාශය තුලට නොගෙන ව්‍යාපෘති ගිණුම් වලට හර කර තිබුණි. | විගණනයෙන් පෙන්වා දුන් මෙම කරුණ සම්බන්ධව තවදුරටත් අධ්‍යනය කරමින් පවතින අතර 2024 වාර්ෂික ගිණුම් තුලින් ඒ සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරිම හෝ නිවැරදි කිරිමක් සිදු කළ යුතු නම් එය සිදු කිරිමට කටයුතු කරමින් පවති. | අධිකාරිය වෙත සංවර්ධන වැඩසටහන් සඳහා ලැබෙන අමාත්‍යාංශ ප්‍රදාන සහ විදේශ ප්‍රදාන ප්‍රමිතය ප්‍රකාරව ආදායමට හඳුනාගත යුතු වේ. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දඹුල්ල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයට 2017, 2018 සහ 2019 වර්ෂවලදී ලැබුණු ආදායම්වලින් බැංකුගත නොකර අවභාවිතා කර තිබුණු රු.1,628,497 ක්වූ ආදායම් 2022 වර්ෂය දක්වාම ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | විමසුමේ සඳහන් මුදල් ප්‍රමාණය 2022 වර්ෂයේ ගිණුම් තුළ රඳවාගත් ඉපැයීම් ලෙස හා ලැබිය යුතු ලෙස හඳුනාගෙන නොමැත. මේ සම්බන්ධ ගැලපීම් 2023 වර්ෂයේ ගිණුම් තුළ සිදු කර ඇත. | මුදල් අවභාවිතය සම්බන්ධයෙන් අවශ්‍ය විමර්ශන සිදුකර අධිකාරියට ලැබෙන සියළුම ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | පුදුකුඩිරිප්පුහි පිහිටි රු.75,880,829 ක්වූ ඉස්සන් අභිජනනාගාරය, ජලජීවී වගා සංවර්ධන හා තත්ත්ව ප්‍රවර්ධන ව්‍යාපෘතිය විසින් 2009 දෙසැම්බර් 30 දින අධිකාරියට භාරදී තිබුණද එය එදින සිට වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි. 2015 ජුනි 22 දිනැති තක්සේරු වාර්තාවට අනුව මෙම අභිජනනාගාර ඉඩම රු.3,721,600 කටද, ගොඩනැගිල්ල රු44,230,000 කටද, ලී බඩු හා සවි කිරීම්, මෝටර් සයිකල්, වායු සමීකරණ යන්ත්‍ර, ජෙනරේටර් හා අනෙකුත් තොග වටිනාකම රු.3,146,550 කටද තක්සේරු කර තිබු අතර එම අයිතම කිසිවක් ගිණුම් ගතකර නොතිබු අතර භාණ්ඩ සමීක්ෂණ වාර්තා වලින්ද මෙම භාණ්ඩවල පැවැත්ම තහවුරු කර නොතිබුණි. මෙම වත්කම් 2016 වර්ෂයේ සිට රාජ්‍ය පෞද්ගලික හවුල් ගිවිසුම් යටතේ බදු දී තිබු අතර මෙම | පුදුකුඩිරිප්පු පිහිටි ඉස්සන් අභිජනනාගාරය ඉදිකිරීම් පිරිවැය හෝ තක්සේරු වටිනාකම ගිණුම් තුලින් හඳුනා ගෙන නොමැත්තේ එම ඉඩම මෙතෙක් අධිකාරියට පවරා ගෙන නොමැති බැවින් වේ. | අධිකාරිය විසින් භාවිතා කරන වත්කම් පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ආයෝජිත වටිනාකම 2016 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වාම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ගතකර නොමැති බැවින් 2022 දෙසැම්බර් 31 දිනට ආයෝජන වත්කම් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඇ) | 2022 වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලට අදාලව රු. 1,050,000 ක්වූ පුදුකුඩිරිප්පුහි පිහිටි ඉස්සන් අභිජනනාගාරය වෙනුවෙන් ලැබිය යුතු බදු මුදල ගිණුම්ගත කර නොතිබුණු අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය සහ ලැබිය යුතු ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | 2023 ගිණුම් තුලින් නිවැරදි කර ඇත. | ලැබිය යුතු බදු මුදල් නිවැරදිව ගිණුම්ගත කල යුතු වේ. |
| (ඈ) | 2017 වර්ෂයේ සිට 2020 දක්වා අමාත්‍යාංශ ප්‍රදාන වලින් ඉදිකර තිබුණු හම්බන්තොට රැකව ක්‍රැබ්සිටි අභිජනනාගාරය සඳහා වූ රු.221,719,566 ක වියදම ජංගම නොවන වත්කම් හා විලම්භිත ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එම වටිනාකම විලම්භිත ආදායම් ගිණුමෙන් ඉවත් කර කල්බදු අවිනිශ්චිත ආදායම් ගිණුමක් ලෙස ජංගම නොවන බැරකම් යටතේ ඇතුලත් කර තිබුණි. | 2022 වර්ෂය තුලදී ගිණුම් තුලින් හඳුනාගෙන ඇත්තේ ආයෝජන කළ රැකව වත්කමේ සම්පූර්ණ ආයොජන වටිනාකම වන රු.221,719,566 මුදල වේ. ගිවිසුම්ගත මුදල පමණක් ගිණුම් තුලින් හඳුනාගනු ලැබුවේ නම් ආයෝජන වත්කමේ නිවැරදි වටිනාකම නිරූපණය නොවේ. | ආයෝජන දේපළ නිවැරදිව හඳුනාගත යුතු වේ. |
| (ඉ) | කෙරීගෙන යන වැඩ ප්‍රාග්ධනිත කිරීමේදී රු.301,139,489 ක්වූ කෙරීගෙන යන වැඩ වටිනාකම රු305,691,169ක් ලෙස ප්‍රාග්ධනිත කිරීමෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වත්කම් හා අමාත්‍යාංශ ප්‍රදාන රු.4,551,680 වැඩියෙන් දක්වා තිබුණි. | නැවත පරීක්ෂා කර නිවැරදි කිරිමට ඇති වටිනාකම් ගැලපීම් කරනු ලැබේ. | කෙරීගෙන යන වැඩ නිවැරදිව ප්‍රාග්ධනිත කර ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඊ) | කොන්ත්‍රාත් බිල්පත් සඳහා ගෙවිය යුතු රු.4,016,127 ක්වූ කොන්ත්‍රාත් වටිනාකම ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත නොකර දේශිය ප්‍රදානවලට බැර කිරීම නිසා ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | එකඟ වේ. | කොන්ත්‍රාත් බිල්පත් සඳහා ගෙවිය යුතු කොන්ත්‍රාත් වටිනාකම ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කළ යුතු වේ. |
| (උ) | අමාත්‍යාංශ හා රජයේ ආයතන විසින් අධිකාරියට භාර දී ඇති දැනට භාවිතා කරන හෙක්ටයාර් 62.7702ක ඉඩම් 10 ක්, අක්කර 10 ½ ක ඉඩම් 2 ක් සහ පර්. 41.197ක ඉඩම්වල වටිනාකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. | 2022 වර්ෂයේ පවරා නොගත් හා තක්සේරු වාර්තා ලද ඉඩම් සම්බන්ධ හෙළිදරව් කිරිම ගිණුම්කරණ ප්‍රතිපත්ති 2.9.1 හා 2.9.2 යටතේ හෙළීදරව් කර ඇත. තක්සේරු වාර්තා ලද ඉඩම් | අධිකාරියට භාර දී දැනට භාවිතා කරන ඉඩම් සම්බන්ධයෙන් වටිනාකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | 04ක් ගිණුම් තුලින් ගැලපීම් සිදු කර නොමැත්තේ සියලු ඉඩම් සම්බන්ධ ගැලපීම් එකවර සිදු කිරිමේ අරමුණින් වේ. | |
| (ඌ) | 2014 ජූලි 16 දිනැති තක්සේරු වාර්තා අනුව බත්තුළුඔය ජලජීවි වගා කාර්යාලයේ ඉඩම රු.4,000,000 කට තක්සේරු කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී එය රු. 2,599,000ක් ලෙස ගිණුම් ගතකර තිබීමෙන් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ ශේෂය රු.1,401,000 අඩුවෙන් දැක්වුණි. | මේවන විට සියලු ඉඩම් තක්සේරු කිරිම සඳහා තක්සේරු දෙපාර්තමේනතුවට ඉදිරිපත් කර ඇති අතර සියලු තක්සේරු වාර්තා ලැබීමෙන් අනතුරුව මූල්‍ය ප්‍රකාශනය තුළ ගැලපීම් සිදු කිරිමට නියමිතය. | අධිකාරියේ වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ ඒකක 4782 ක්වූ රු.1,008,663 වටිනා මියගිය මව් මත්ස්‍ය (Death Brood Stock) තොගය වර්ෂයේ පාඩු හා හානි ලෙස වියදමට ගිණුම්ගත කර නොමැති බැවින් ශුද්ධ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් නිරූපණය වී තිබුණි. | සටහන් අංක 11 න් ආරම්භක හා අවසාන ශේෂ අතර වෙනස තුල වර්ෂය තුළ මව් මත්ස්‍ය වැඩි වීම් හා අඩු වීම් ගැලපී ඇත. වාර්ෂික මව් මත්ස්‍ය වටිනාකම තක්සේරු කිරිම මත ඇති වූ ලාභය වාර්ෂික දළ ලාභය/අලාභය ගණනය කිරිමේ දී හඳුනා ගෙන ඇත. ඒ අනුව මත්ස්‍ය මියයෑම් වෙනම නොපෙන්වීම තුලින් අධිකාරියේ ලාභයට කිසිදු වෙනසක් සිදු වී නොමැත. | මියගිය මව් මත්ස්‍ය (Death Brood Stock) තොගය වර්ෂයේ පාඩු හා හානි ලෙස ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඒ) | උඩවලව (නව) සහ දඹුල්ල (genetic) මධ්‍යස්ථානයන්හි 2022 දෙසැම්බර් 31 දිනට කි.ග්‍රෑ.1878 ක් සහ ඒකක 7560 ක්වූ රු.2,759,315 ක් වටිනා මව් මත්ස්‍ය තොග ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජීව මත්ස්‍ය තොගයට ඇතුලත් කර නොතිබීම නිසා එම ප්‍රමාණයෙන් ජංගම නොවන වත්කම් අඩුවෙන් හා වර්ෂයේ විකුණුම් පිරිවැය වැඩිවී ලාභය අඩුවෙන් දැක්වුණි. | එකඟ වේ. නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ. | මව් මත්ස්‍ය තොග ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජීව මත්ස්‍ය තොගයට ඇතුලත් කළ යුතු වේ. |
| (ඔ) | 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.2,855,551 ක්වූ හිඟ වැටුප් හා වේතන වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී කල ගෙවීම් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ලාභය අඩුවෙන් දැක්වුණි. | එකඟ වේ. | සමාලෝචිත වර්ෂයේදී ගෙවූ හිඟ වැටුප් හා වේතන නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඕ) | 2022 වර්ෂයේ ඉඩම් සඳහා ඉදිරිපත් කරන ලද උපලේඛණයන්හි රු.225,000 ක වටිනාකමකට මිලදීගත් ඉඩමක් ඇතුළත් කර නොතිබූ අතර තක්සේරු කරන ලද එකතු වටිනාකම රු.32,971,600 ක්වූ අක්කර 10.5 ක ඉඩම් 02 ක් සහ හෙක්ටයාර 0.3772 ක ඉඩම් 02 ක් ගිණුම් ගතකර නොතිබුණි. | ඉඩම් ශේෂය සඳහා නිවැරදි උපලේඛණය ඇමුණුම 06 න් ඉදිරිපත් කර ඇත. | අධිකාරියේ වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ක) | 2018 වර්ෂයේ සිට පැවත එන ව්‍යාපෘති සඳහාවූ ප්‍රතිපාදන වියදම් කර ඉතිරි වූ රු.4,812,922ක ශේෂය අදාළ ආයතන වෙත ගෙවීමට හෝ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම හෝ කර නොතිබුණි. | මෙම වැය විෂයයන් සඳහා ලද ප්‍රතිපාදන වියදම් කර ඉතිරි මුදල් වන අතර එම ව්‍යාපෘති මෙහෙයවන ලද අංශ හරහා නැවත පරික්ෂා කර මෙම ශේෂ නැවත අදාල ආයතන වෙත ලබා දීමට හෝ අවශ්‍ය කටයුතු ගිණුම් මඟින් සිදු කිරිමට කටයුතු කරනු ලැබේ. | ව්‍යාපෘති ප්‍රතිපාදන වලින් වියදම් කර ඉතිරි වන මුදල් අදාළ ආයතන වෙත ගෙවීමට හෝ ආදායමක් ලෙස නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ග) | ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් රු. මිලියන 143ක් වැයකර මඩකලපුව දිස්ත්‍රික්කයේ බහු විශේෂ කරදිය වරල් මත්ස්‍ය අභිජනනාගාරයක් ඉදිකර 2017 ජූනි 29 වන දින අධිකාරියට භාරදී තිබුණි. 2022 සැප්තැම්බර් 08 වන දින එම වත්කම රු.155,450,000 කට තක්සේරු කර තිබුණද එය මෙතෙක් අධිකාරියට පවරාගෙන එම වටිනාකම ගිණුම් ගතකර නොතිබීම හේතුවෙන් එම වටිනාකමින් ජංගම නොවන වත්කම් හා රජයේ ප්‍රදාන අඩුවෙන් දැක්වුණි. | මඩකළපුව බහු විශේෂ කරදිය වරල් මත්ස්‍ය අභිජනනාගාරයේ තක්සේරු වටිනාකම ගිණුම් තුලින් හඳුනා ගෙන නොමැත්තේ එම ඉඩම මෙතෙක් අධිකාරියට පවරා ගෙන නොමැති බැවින් වේ. | අධිකාරිය විසින් භාවිතා කරන වත්කම් පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ තොග සමීක්ෂණයක් නොකර, මධ්‍යස්ථාන භාරව සිටින ස්ථානභාර නිළධාරින්ගෙන් කැඳවන වාර්තා අනුව තොග වටිනාකම රු.101,615,570 ක් ලෙස ගිණුම් ගතකර තිබු අතර තොග සමීක්ෂණයකින් තොරව දක්වා ඇති මෙම වටිනාකමෙහි | 101,615,570 | තොග සමීක්ෂණ වාර්තා | අධිකාරිය විසින් වාර්ෂික තොග සමික්ෂණ කමිටුවක් මඟින් තොග ගණනය කිරිමක් මෙතෙක් සිදු කර නොමැත. අධිකාරියේ ව්‍යාප්තිය හා අධිකාරියේ තොග අතර ජීව තොග පැවතීම මත මෙය යම් අසීරු කාර්යයකි. නමුදු විගණනයෙන් පෙන්වා | තොග වටිනාකමෙහි නිවැරදිතාවය හා පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා තොග සමීක්ෂණයක් සිදු කර වාර්තා ඉදිරිපත් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| නිවැරදිතාවය හා පැවැත්ම තහවුරු නොවීය. | | දී ඇති අයුරින් 2024 වර්ෂයේ දී සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 136, 137, 138, 139 | ආයතනය තුල මෘදුකාංග පද්ධතියක් ක්‍රියාත්මක වුවද, එම මෘදුකාංගය පද්ධතියට දත්ත ඇතුලත් කිරීම, දත්ත පරීශිලනය, වාර්තා ලබා ගැනීම හා සංශෝධනය කිරීම යන කාර්යයන් සඳහා අධිකාරිය නිසි පරිදි බලතල පැවරීමක් සිදු කර නොතිබුණි. | මෘදුකාංගය සම්බන්ධව අභ්‍යන්තර චක්‍රලේඛයක් කෙටුම්පත් කර ඇති අතර සියලුම නිළධාරින් සඳහා අවශ්‍ය පුහුණුව මෘදුකාංගයට මධ්‍යස්ථානය සම්බන්ධ කරන අවස්ථාවේ දීම ලබා දී ඇත. එමෙන්ම මධ්‍යස්ථානය මෘදුකාංගයට සම්බන්ධ කිරීම සඳහා වෙනම මුරපද ලබා දී ඇති අතර මේ වන විට සම්බන්ධ කර ඇති මධ්‍යස්ථානයන් මඟින් ඇතුලත් කරනු ලබන දත්තයන් කිසිවකුට වෙනස් කිරීමට හෝ මකා දැමීමට නොහැක. ඒ අනුව ඇතුලත් කර ඇති දත්තයන්හී නිරවද්‍යතාවය සහතික කළ හැක. සම්බන්ධ නොකළ මධ්‍යස්ථාන ද 2024 වර්ෂයේ සම්බන්ධ කිරීමට නියමිතය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) 2022 ජූලි 08 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 30/94 (4.4) | රාජ්‍ය සංස්ථා විසින් ප්‍රයෝජනයට ගනු ලබන විදේශාධාර සම්බන්ධව වැය ඇස්තමේන්තුවට ප්‍රතිපාදන සලසා රේඛීය අමාත්‍යාංශය හරහා ආයතනය වෙත විදේශ ප්‍රදාන ලැබිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අධිකාරිය වෙත ලැබී ඇති රු.මි.10.45 ක්වූ විදේශ ප්‍රදාන සම්බන්ධයෙන් එම විධි විධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් කඩිනමින් අප ආයතනය වෙත ලබා දිමේ අවශ්‍යතාවය මත අදාල මූල්‍යාධාර සපයන සංවිධානය විසින් සෘජුවම අප අධිකාරිය වෙත මෙම මුදල් බැර කර ඇත. නමුදු ඉදිරියේ දී අදාළ චක්‍රලේඛ අනුව කටයුතු කරනු ලැබේ. | විදේශ ප්‍රදාන සම්බන්ධයෙන් චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ)විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2011 අප්‍රේල් 21 දිනැති අංක MOEF/ERD/2011/ | විදේශ ප්‍රදාන ලබාදීම සහ ගිවිසුම්වලට එළඹීම සම්බන්ධ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීම සහ භාණ්ඩාගාරයේ | මෙම මුදල් කඩිනමින් අප ආයතනය වෙත ලබා දිමේ අවශ්‍යතාවය මත අදාල මූල්‍යාධාර සපයන සංවිධානය විසින් සෘජුවම | විදේශ ප්‍රදාන සම්බන්ධයෙන් චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතු |

| | | | |
|---|---|---|---|
| 01දරන චක්‍රලේඛය හා 2014 ජූනි 26 දිනැති අංක MOEF/ERD/2014/ 01 දරන චක්‍රලේඛය | අනුමැතිය ලබා ගැනීම සිදුවිය යුතු වුවද අධිකාරිය වෙත ලැබී ඇති රු.මි.10.45 ක්වූ විදේශ ප්‍රදාන සම්බන්ධව ඒ අයුරින් කටයුතු කර නොතිබුණි. | අප අධිකාරිය වෙත මෙම මුදල් බැර කර ඇත. නමුදු ඉදිරියේ දී අදාළ චක්‍රලේඛ අනුව කටයුතු කරනු ලැබේ. | කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.103,989,075 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තයක් රු.32,567,704ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.71,421,371 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආදායම සහ වෙනත් ආදායම් රු.75,860,652 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.8,262,017 ක්වූ කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගතකර තිබුණු කොන්ත්‍රාත් අංක 2021/R/MURL/01 දරන හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුරුතුවෙල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් මේ වන තෙක් ඉටු වී නොතිබුණි. | සමථකරණ තීරණය අනුව අධිකාරියට අයවිය යුතු මුදල් කොන්ත්‍රාත්කරුගේ අත්තිකාරම් ඇපකරය මුදල් කරගැනීමෙන් අයකරගත් බව දන්වා සිටිමි. | ව්‍යාපෘති කටයුතු සැලසුම් කළ පරිදි කඩිනමින් නිමකළ යුතු වේ. |
| (ආ) | හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුරුතවෙල වගා සංවර්ධන මධ්‍යස්ථානයේ කොන්ත්‍රාත් අංක 2021/R/MURL/02 දරන ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමේ කොන්ත්‍රාත්තුව දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2022 අප්‍රේල් 20 වන දින අවලංගු කර තිබුණි. අත්තිකාරම් හා ගෙවීම් බිල්පත් ලෙස ගෙවූ රු.4,412,475 ක මුදල අයකර ගැනීමට නොහැකිවී තිබූ අතර ගෙවූ මුදලද නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | අත්තිකාරම් සුරක්ෂණය වලංගුතාවය 24.03.2022 දක්වා දීර්ඝ කර ඇත. කාර්යසාධන ඇපකරයේ මුදල් අය කර ගත්තද අත්තිකාරම් ඇපකරයට අදාල මුදල අය කර ගැනිමට නොහැකි විය. එම සමාගම සමඟ 2023.11.09 දින සාකච්ඡාවක් පැවති අතර ඒ අනුව එම සමාගම විසින් ලිපියක් අප වෙත ඉදිරිපත් කර ඇති අතර එම ලිපිය අධ්‍යනය කර අවශ්‍ය කටයුතු සිදු කිරිමට නියමිතය. | අත්තිකාරම් හා ගෙවීම් බිල්පත් ලෙස ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | ඊකව අක්කර 42 ක ඉඩම් වපසරියක මඩ කකුළුවන් වගා කිරීමේ ව්‍යාපෘතියක් සඳහා අමාත්‍යාංශ අරමුදල් රු.මිලියන 221 ක් වැයකර ඉදිකිරීම් නිම කරන ලද පොකුණු හා ඒ ආශ්‍රිත ඉදිකිරීම්, | 2022 වර්ෂය තුලදී ගිණුම් තුලින් හදුනාගෙන ඇත්තේ ආයෝජන කළ ඊකව වත්තමෙ සම්පූර්ණ ආයොජන වටිනාකම වන රු.221,719,566 මුදල වේ. ගිව්සුම්ගත මුදල පමණක් | පනතේ කාර්තව්‍යන් ඉටුවන අයුරින් අධිකාරිය ව්‍යාපෘති සැලසුම් ඉදිරිපත් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතිය අසාර්ථක වීම මත කිවුල් දිය ඉස්සන් වගාව සඳහා පෞද්ගලික ආයෝජකයෙක් වෙත 2021 දෙසැම්බර් 02 දින 30 අවුරුදු කාලයකට බදුදී තිබුණි. 1998 අංක 53 දරන ජලජීවි වගා සංවර්ධන පනත අනුව රජයේ මුදල් වැය කරමින් ජලජීවි වගා මධ්‍යස්ථාන ඉදිකිරීමෙන් අනතුරුව පෞද්ගලික පාර්ශවයන් වෙත බදුදීම අධිකාරියේ මූලික කාර්යයක් නොවන අතර පනතින් ජලජීවි වගා ප්‍රවර්ධනය හා සුළු හා මධ්‍ය පරිමාණ ආයෝජන දිරි ගැන්වීම සඳහා පමණක් ප්‍රතිපාදන සලසා දී තිබුණි.<br>2019 මාර්තු 26 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2/2019 ප්‍රතිපාදන ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය සඳහා පුද්ගලික අංශය විසින් මුදල් යොදවා නොමැති බැවින් රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යවසායකත්ව ව්‍යාපෘතියක් ලෙස සැලකිය නොහැකි වුවද රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යවසාකත්ව ව්‍යාපෘතියක් ලෙස අභිලාෂ කැඳවා තිබුණි. | ගිණුම් තුලින් හඳුනාගනු ලැබුවේ නම් ආයෝජන වත්කමේ නිවැරදි වටිනාකම නිරූපණය නොවේ. තවද සම්පූර්ණ මුදල ගිණුම් තුලින් හඳුනාගෙන ඇත්තේ මෙම අයෝජන වත්කමේ වටිනාකමින් පළමු ආයොජකගේ කාලපරිච්ඡේද තුල අය නොවන වටිනාකම පසුව ගිවිසුම්ගත වන පෞද්ගලික හවුල්කරුගෙන් අයකර ගැනීමට නියමිත බැවිනි. | |
| (ඈ) | දිවි නැගුම ව්‍යාපෘතිය සඳහා අධිකාරිය විසින් 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ප්‍රතිලාභීන් 6450 කට රු.229,035,250 ක මුදලක් ලබාදී තිබුණද ලබාදුන් එම මුදල ගිණුම් ගතකර නොතිබුණි. ප්‍රතිලාභීන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට නිසි ක්‍රමවේදයන් හඳුන්වාදී නොතිබුණු අතර යාවත්කාලීන කරන ලද ණයගැති ලේඛනයක්ද අධිකාරිය සතුව නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභීන්ගෙන් එකතු කළ රු.66,326,302 ක් මුදල චක්‍රිය අරමුදලක් ලෙස නොව ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර එම මුදල් කුමන ප්‍රතිලාභියාගෙන් ලැබී තිබුණේද යන්න තහවුරු කරගත හැකි ලිඛිත සාක්ෂි අධිකාරිය සතුව නොතිබුණි. මුදල් අය නොවීම සම්බන්ධයෙන් නඩු 193ක් පවරා තිබු අතර මූල්‍ය ප්‍රකාශන තුළ පෙන්නුම් කරන රු. | දිවිනැගුම ප්‍රතිලාභීන් සම්බන්ධ ලේඛණයක් සැලසුම් හා අධීක්ෂණ ඒකකයේ පවත්වාගෙන යනු ලබන අතර ප්‍රතිලාභීන් එම උසාවියෙන් නියම කල මුදල් උසාවියට ගෙවීම් කල අවස්ථා මෙන්ම වාරික වශයෙන් උසාවියට ගෙවීම් කල අවස්ථා පැවතීම, උසාවිය විසින් අධිකාරිය වෙනුවෙන් අය කල සියලුම වර්ගයේ මුදල් මාසිකව චෙක්පතකින් යොමුකල ද එම අයකරගත් මුදල් පිළිබඳව විස්තර වාර්තා නිවැරදිව ඉදිරිපත් නොකිරිම ආදී කරුණු හේතුවෙන් මෙම ලේඛණය යාවත්කාලින කිරිම ගැටලු සහගත තත්වයක් උද්ගතව ඇත. | ප්‍රතිලාභීන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට නිසි ක්‍රමවේදයන් හඳුන්වාදීය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 3,572,500 ක්වූ ණය අයකර ගැනීමද අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. | | |
| (ඉ) | වේක්කයා මසුන් අභිජනනාගාරය හා කරදිය විසිතුරු මත්ස්‍ය අභිජනනාගාරය ඉදිකිරීම් කටයුතු 2018 වර්ෂයේ ආරම්භ කර 2022 ඔක්තෝම්බර් 10 දින අවසන් කර තිබුණි.මේ සඳහා රු.309,976,861 ක් හා රු.212,124,697ක් පිරිවැයක් දරා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ. | | |
| | (i) ඉහත පරිදි පිරිවැය දරා තිබුණද රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2022 දින 01 දෙසැම්බර්ට වේක්කයා මසුන් අභිජනනාගාරය රු 144,316,000.ක් ලෙස හා කරදිය විසිතුරු මත්ස්‍ය අභිජනනාගාරය රු129,010,00. ක් ලෙස තක්සේරු කර තිබුණි. | වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 4/2018 ඡේද 2.2.2.2 අනුව තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් වෙළඳපොල වටිනාකම තීරණය කිරීම නිවැරදි නොවේ. එමනිසා 2014.01.01 සිට 2018.12.31 කාල පරාසය හෝ ඊට පසුව ඉදිකල ගොඩනැඟිලි සඳහා " මෙම කාල පරාසය තුල ඉදිකර ඇති ගොඩනැඟිලි නැවත වරක් තක්සේරු කිරීමට අවශ්‍ය නොවේ. | මූල්‍ය අලාභයන් ඇතිනොවන අයුරින් කටයුතු කල යුතු වේ. |
| | (ii) මෙම අභිජනනාගාරයන් සඳහා උපදේශන සේවාව සපයා තිබුණේ එකම පුද්ගලික ආයතනයකින් වන අතර ඒ සඳහා එම ආයතනයට රු .මි.46 ක මුදලක් ගෙවා තිබුණද බිල්පත්හි කලවැඩ වටිනාකම සහතික කිරීම අධිකාරියේ ඉංජිනේරු ඒකකයක් තිබියදි එම උපදේශන සේවා ආයතනය විසින් සිදු කිරීම නිවැරදිද යන්න ගැටලුකාරී විය. | එම උපදේශන ආයතනය විසින් පැහැදිලිවම අදාල වැඩ වටිනාකම සහතික තර ඇති බව අදාල සහතිකපත් මඟින් පැහැදිලි වේ. | කලවැඩ වටිනාකම සහතික කිරීම සම්බන්ධයෙන් නිවැරදි ක්‍රමවේදයකින් සිදු කළ යුතු වේ. |
| | (iii) වේක්කයා මසුන් අභිජනනාගාරය නිෂ්පාදන කටයුතු වෙනුවෙන් භාවිතා නොකිරීම නිසා, අභිජනනාගාරය ඉදිකිරීම් වෙනුවෙන් වැයවූ රු . 309,976,861 ක මුදල හා ඒ සඳහා 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා දැරූ රු . 9,366,143 ක්වූ පුනරාවර්තන වියදම නිෂ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි. | පිළිතුරු ලබාදී නැත. | වේක්කයා මසුන් අභිජනනාගාරය නිෂ්පාදන කටයුතු වෙනුවෙන් භාවිතා කළ යුතු වේ. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මත්ස්‍ය ටැංකිවල ධාරිතාවය හා 2022 වර්ෂයේදී මධ්‍යස්ථාන 4ක වර්ග මීටර 34320 ක ධාරිතාවයකින් යුතු මත්ස්‍ය ටැංකි නිෂ්කාර්යව පැවති අතර රම්බඩගල්ල විසිතුරු මත්ස්‍ය ටැංකි අතරින් ටැංකි 200 ක්ද අලුත්වැඩියා කලයුතු මට්ටමේ පැවතියද ක්‍රියාකාරී නිෂ්පාදන මට්ටමට පත්කර ගැනීමට කටයුතුකර නොතිබුණි. | උඩවලව නව මධ්‍යස්ථානය නිෂ්කාර්යය ව.මී. 6,700 ප්‍රමාණය මේ වන විට අළුත්වැඩියා කටයුතු සිදුකර මෙම වර්ෂයේ මාර්තු මස සිට මධ්‍යස්ථානයේ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගෙන ඇත. ඉඟිණියාගල මධ්‍යස්ථානය නිෂ්කාර්යය ව.මී. 4,500 ප්‍රමාණය මේ වන විට ව.මී. 1,750 අළුත්වැඩියා කටයුතු සිදු කර නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදවා ඇති අතර ඉතිරි ව.මී. 2,750 ප්‍රමාණය 2024 වර්ෂය තුළ දී අළුත්වැඩියා කිරීමට නියමිතව ඇත. මුරුතවෙල මධ්‍යස්ථානය නිෂ්කාර්යය ව.මී. 8,360 ප්‍රමාණය මේ වන විට පොකුණු 02 ක් ව.මී. 1,600 ප්‍රමාණයක් අළුත්වැඩියා කටයුතු සිදු කර මේ වන විට වගාව සඳහා යොදාගෙන ඇත. ඉරණමඩු මධ්‍යස්ථානය නිෂ්කාර්යය ව.මී. 3,510 ප්‍රමාණය මේ වන විට අළුත්වැඩියා කර දීමට තීරණය වී ඇත. 2024 වර්ෂය තුලදී නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදවා ගැනීමට නියමිතයි.<br>උඩවලව මධ්‍යස්ථානය නිෂ්කාර්යය ව.මී. 21,300 ප්‍රමාණය වර්ෂ ගණනාවක සිට ක්‍රියාකාරී තත්ත්වයේ නොවූ අතර මේ වන තුරුත් අළුත් වැඩියා කටයුතු සිදු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් වී නොමැත. | මත්ස්‍ය ටැංකිවල ධාරිතාවය ක්‍රියාකාරී නිෂ්පාදන මට්ටමට පත්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | අවලංගු කරන ලද කොන්ත්‍රාත් දෙකක් සම්බන්ධයෙන් අධිකාරියට අයවිය යුතු රු.11,213,291 ක මුදල් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2021/R/MURL/01 කොන්ත්‍රාත්තුවට සම්බන්ධව ගිණුම්ගත කර ඇති වටිනාකමින් රු.8,147,748 ක් සමථකරණයේ දී ලබා දුන් තීරණය අනුව අත්තිකාරම් බැඳුම්කරයෙන් අය කරගෙන ඉතිරි මුදල කොන්ත්‍රාත් සමාගමට නැවත ගෙවන ලදි. ගිණුම් අනුව ශේෂ හා අයකර ගත් අගය අතර වෙනස 2024 වාර්ෂයේ ගිණුම් තුලින් ගැලපීම් කිරිමට කටයුතු කිරිමට | අයවිය යුතු මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | නියමිතය. 2021/R/MURL/02 කොන්ත්‍රාත්තුවට සම්බන්ධව අයවීමට ඇති මුදල සඳහා කොන්ත්‍රාත් සමාගමට නීති නිළධාරිනිය විසින් යොමු කළ ලිපියට ලබා දුන් පිළිතුරට උපදෙස් ඉල්ලා නීතිපති දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර ඇත. නීතිපති විසින් ලබා දෙනු ලබන උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදු කිරිමට නියමිතය. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී විදේශ ප්‍රදාන ලෙස අධිකාරිය වෙත ලැබී තිබුණු රු.10,454,968 විදේශ ප්‍රදානවලින් අදාළ අරමුණු සඳහා රු.878,423ක් එනම් සියයට 8.40 ක් පමණක් උපයෝජනය කර තිබුණි. | 2022.12.31 දින වන විට රු.7,697,742.00ක මුදලක් ILO ආයතනය හරහා අප අධිකාරිය වෙත ලැබී ඇති අතර එම ප්‍රතිපාදන මඟින් විවිධ උපකරණ හා නෙට් වර්ග මිලදී ගැනිමට 2023 වර්ෂයේ දි ආරම්භ කල නමුත්, ප්‍රමාණවත් සැපයුම්කරුවන් සොයා ගැනිමට නොහැකි විම මත එම මිලදී ගැනිම් සම්පූර්ණ නොවිය. ඒ අනුව , නැවත ලංසු කැඳවිමට කටයුතු කර එම උපකරණ හා නෙට් වර්ග මිලදී ගැනිමට කටයුතු කරමින් පවති. | අධිකාරිය වෙත ලැබී තිබුණු සියළුම විදේශ ප්‍රදාන අදාළ අරමුණු සඳහා උපයෝජනය කළ යුතු වේ. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උපදේශන සේවා ආයතනයක් වෙත 2016 හා 2017 වර්ෂවලදී ගෙවන ලද රු.4,683,789 ක්වූ මුදලට අදාළව උපදේශන සේවා සම්පූර්ණ කර නොතිබියදී නැවත වරක් 2022 වර්ෂයේ මඩකලපු දිස්ත්‍රික්කයේ ජලජීවී උයනක් ඉදි කිරීම සඳහා සැලසුම් කිරීමේ හා ඉදිකිරීමේ උපදේශන සේවා කටයුතු එම ආයතනයටම රු.4,219,408 ක මුදලකට පිරිනමා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෙම කොන්ත්‍රාත්තුවට අදාළව රු.1,538,750 ක් ප්‍රාග්ධනිත කර තිබුණද අදාළ වැඩ සම්පූර්ණ කර නොතිබු බැවින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබු අතර එම ගෙවීම්ද නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | මෙහි සඳහන් ව්‍යාපෘති එකිනෙකට වෙනස් ස්ථාන වන අතර ඉන් ලබාගත් Conceptual Plan අනුව අදාල පරිසර අනුමැතීන් ලබා ගැනීමටත් EOI කැඳවා ආයොජකයන් වෙත කොටස් ලබා දීමටත් කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | මඩකලපු දිස්ත්‍රික්කයේ ජලජීවී උයනක් ඉදි කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගාල්ල සමනල උද්‍යානයේ විසිතුරු මසුන් ඒකකය (Ornamental Fish Display Unit) වැඩිදියුණු කිරීම සඳහා අධිකාරිය විසින් රු.13,135,274 ක් වැයකර තිබුණද විසිතුරු මසුන් ඒකකය නිසි පරිදි ක්‍රියාත්මක නොවීමෙන් වැය කරන ලද මුදල නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | උක්ත සමනළ උද්‍යානයේ විසිතුරු මසුන් ඒකකය නඩත්තු කටයුතු සඳහා නගර සභාව සමඟ ගිවිසුමකට එළඹ ඇති අතර, එහි අඩුපාඩු කටයුතු කොන්ත්‍රාත්කරුගෙන් රඳවා තබාගත් මුදලින් සිදුකර නිවැරදි කිරිම සඳහා වන දැන්වීම කොන්ත්‍රාත්කරු වෙත දන්වා යවා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | ගාල්ල සමනල උද්‍යානයේ විසිතුරු මසුන් ඒකකය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | අදාළ ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් අධිකාරියේ ප්‍රයෝජනය සඳහා අමාත්‍යාංශය වෙත භාරදී තිබුණු හෙක්ටයාර් 137.0294ක මන්නාරම හා වව්නියාව යන ප්‍රදේශවල ඉඩම් 02 ක් හා අක්කර 2 බැගින් වූ මුලතිව් හා යාපනය යන ප්‍රදේශවල ඉඩම් 02ක් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | ගොඩනැගිලි ඉදි කිරීම සඳහා අවශ්‍ය තරම් මුදල් ආසියානු සංවර්ධන යෝජනා ව්‍යාපෘතිය මඟින් ලබා ගත නොහැකි වූ නිසා , එම කටයුතු සිදු කළ නොහැකි විය. තව ද ඉහත ඉඩම් මේ වන තෙක් අධිකාරියට පවරා ගැනීමේ කටයුතු ද සිදු වී නොමැත. එම පැවරීම් කටයුතු සිදු වූ පසු මෙම ඉඩම් ඵලදායී ලෙස ආයෝජනය කිරීමට බලාපොරොත්තු වේ. | අධිකාරියේ ප්‍රයෝජනය සඳහා ලබාදී තිබූ වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | අධිකාරියට හිමිකාරිත්වය නොමැති හෙක්ටයාර් 1361.76 ක ඉඩම් 04ක සහ වපසරිය හඳුනාගත නොහැකි ඉඩමක් සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට 2017 වර්ෂයේ සිට රු.මිලියන 107.6 ක මුදලක් වැයකර තිබුණද 2024 මැයි 05 දක්වා කිසිදු ව්‍යාපෘතියක් ආරම්භකර නොතිබූ බැවින් එම වියදම නිෂ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි. | මෙම ඉඩම් නිදහස් කරගැනීමට ප්‍රායෝගිකව දීර්ඝ කාලයක් ගතවීම මෙම ව්‍යාපෘති ආරම්භ කිරිම ප්‍රමාදයට ප්‍රධාන හේතුවයි. ගල්මුල්ල ව්‍යාපෘතිය මෙම වර්ෂයේ ආරම්භ කිරිමට කටයුතු සිදු කරමින් පවතින අතර අනෙක් ව්‍යාපෘතිද නුදුරු ඉදිරි කාලයේදී ආරම්භ කිරිමට නියමිත බැවින් මෙම ව්‍යාපෘති වෙනුවෙන් වැය කර ඇති රු. මිලියන 107.6 ක මුදල නිෂ්කාර්ය වියදමක් ලෙස සැලකිය නොහැක. | යටිතල පහසුකම් සංවර්ධනය කළ ඉඩම්වල අදාල ව්‍යාපෘති ආරම්භකිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | තිලාපියා මත්ස්‍යයන් සඳහා අවශ්‍ය ආහාර නිපදවීමට 2019 ඔක්තෝබර් 08 දින රු.11,802,000 ක් වටිනා උඩවලව මත්ස්‍ය ආහාර සැකසුම් මධ්‍යස්ථානයේ ස්ථාපිත කර තිබූ මත්ස්‍ය ආහාර නිෂ්පාදන යන්ත්‍රය මඟින් වාර්ෂිකව තිලාපියා මත්ස්‍ය ආහාර කිලෝග්‍රෑම් 127,000 ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කළද, 2021 හා 2022 වර්ෂයේ කිලෝ ග්‍රෑම් 36,612 ක් හා කිලෝ ග්‍රෑම් 38,361 ක් එනම් සියයට 28 ක් හා සියයට 30ක ප්‍රතිශතයක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. මේ වනවිට මෙම යන්ත්‍රය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | මෙම යන්ත්‍රය රාජ්‍ය හා පුද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ඉදිරියට කරගෙන යාමට සඳහා දැනට අභිලාශයන් කැඳවා ඇති අතර මෙම හවුල් ව්‍යාපාරය සඳහා වටිනාකම තක්සේරු කිරිමට 2023.03.15 වන දින තක්සේරු දෙපාර්තමේන්තුවට ඉල්ලුම් කරන ලදී. දැනට මෙම යන්ත්‍රය හා ගොඩනැගිල්ල තක්සේරු කර ඇති අතර එම වාර්ථාව මේ දක්වා ලැබී නැත. මෙම තක්සේරු වාර්ථාව ලැබීමෙන් පසුව මෙම රාජ්‍ය පුද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස පවත්වා ගෙන යාමට අවශ්‍ය | තිලාපියා මත්ස්‍යයන් සඳහා අවශ්‍ය ආහාර නිපදවීමේ යන්ත්‍රය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | කටයුතු සිදුකරමින් පවතී. | |
| (ඊ) | ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් රු.6,929,664 ක්වූ උපදේශන සේවා ගාස්තු ගෙවා තිබුණද එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එකී මුදල් නිශ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි. | එක් ව්‍යාපෘතියක ඉඩම් ගැටළුව විසඳා ගත් පසු යෝජිත සැලසුම් අනුව ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. තවත් ව්‍යාපෘතියක් සම්බන්ධව දැනට ගරු අධිකරණයේ පවතින නඩුවේ තීන්දුව අනුව ඉදිරි කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. අනෙක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට යාමේදි ඇති වූ බාධා සහ විරෝධතා ඉවත් කර ගැනීමෙන් පසු පිළියෙල කරන ලද සැලසුම් අනුව අභිලාෂයන් කැඳවා (EOI) ආයෝජකයන් මඟින් අදාල කටයුතු සිදු කරගෙන යනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. | උපදේශන සේවා ගාස්තු ගෙවා තිබුණු ව්‍යාපෘති 03 කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. |